# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1644/27 - 2010 මාර්තු 11 වැනි බ්‍රහස්පතින්දා - 2010.03.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා දැන්වීම්

**බස්නාහිර පළාතේ පළාත් සභාව**

බස්නාහිර පළාත් රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහය - සංශෝධන අංක 1

2006 අප්‍රේල් මස 10 දින හා අංක 1440/24 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද බස්නාහිර පළාත් රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 8.2 ඡේදය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීම අනුමත කරනු ලැබේ.

8.2 තවද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවය බහුකාර්ය සේවයක් කිරීම පිණිස පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සහ පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ දැනට සේවය කරන ලිපිකරුවන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය කිරීමට හා ඉහත සඳහන් ආයතනවල පළාත් ආණ්ඩුකාරතුමා විසින් සේවා ව්‍යවස්ථාව අනුමත කරන දිනට ස්ථිර සේවයේ යෙදී සිටි යතුරු ලේඛකයින්, පොත් තබන්නන්, සරප්වරුන් හා ගබඩා භාරකරුවන් ඔවුන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයට ඇතුලත්වීමට කැමති වන්නේ නම් එකී සේවයට අන්තර්ග්‍රහණය කිරීමට විධිවිධාන සලස්වනු ලැබේ.

එස්. අලවි මව්ලානා,
ආණ්ඩුකාරතුමා,
බස්නාහිර පළාත.

2010 පෙබරවාරි මස 10 වැනි දින,
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
4 වන මහල,
යුනිටි ප්ලාසා ගොඩනැගිල්ල,
කොළඹ 04.

03-864

1A - PG 001127 — 340 (2010/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.